**13-12-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, මේ ඔබේ දිව්‍ය මෙහෙවරයි. ඔබ හැම කෙනාවම පරමාත්ම දෙවියන්ට අයත් කරවා, ඔවුන්ට ඔවුන්ගේ අසීමිත උරුමය ලබා ගැනීමට ඉඩ සළස්වයි.

**ප්‍රශ්නය:** ඉන්ද්‍රියන්ගෙන් සිදුවන හිතුවක්කාරකම් අවසාන වන්නේ කවදාද?

**පිළිතුර:** ඉන්ද්‍රියන්ගෙන් සිදුවන අපචාර අවසන් වන්නේ ත්‍රේත යුග තත්ත්වයට ජීවාත්මය ලඟා වූ විටය. එනම්, සතෝ තත්ත්වයයි. දැන් ඔබ ආපසු ගමන් යන කාලය නිසා ඔබේ ඉන්ද්‍රියන් පාලනයේ තබා ගත යුතුයි. ජීවාත්මය අපිරිසිඳු කරන කිසිඳු ක්‍රියාවක් රහසේ නොකරන්න. අවිනාශී ශෛල්‍ය වෛද්‍යවරයා දෙන උපදෙස් දිගටම පිළිපදින්න.

**ගීතය:** මිනිසුනේ, ඔබේ හදවත නැමති කැඩපතින් මූණ බලන්න!

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා ආධ්‍යාත්මික දරුවන්ට විස්තර කර දෙයි. මෙහි සිටිනා ඔබට පමණක් නොවේ, ඔහු ප්‍රජාපිතා බ්‍රහ්මාගේ මුවින් උපදින සියලු බ්‍රහ්මින් දරුවන්ට විස්තර කරයි. පෙරදී ඔබ කෂුද්‍ර වූ අතර දැන් බ්‍රහ්මින්වරු වී ඇත. පරම පියා විවිධ පරම්පරා වල අය ගැන තේරුම් කරයි. මේ අය ගැන ලෝකය නොදනී. එහෙත් පැසසුමට ලක් වන්නේ ඔවුන්ය. දැන් ඔබ බ්‍රහ්මින් ගණයට අයිති වන අතර පසුව දේව ගණයට අයත් වනු ඇත. මේ කාරණා නිවැරදි දැයි සිතන්න. ඔබම විනිශ්චය කර ගන්න. මට සවන් දීමෙන් පසු සසඳා බලන්න. උපතක් උපතක් පාසා ඔබ අසා ඇති ආගමික කතා හා ඥානය සසඳා බලන්න. නිවැරදි දේ විනිශ්චය කරන්න. ඔබ බ්‍රහ්මින් ගණය හා ආගම සම්පූර්ණයෙන් අමතක කර ඇත. විවිධ ස්වරූප ප්‍රතිරූපය නිවැරදිවම නිර්මාණය කර ඇත. එය භාවිත කර විස්තර කරන්න. කොහොමනමුත්, අත් බොහෝ ඇතිව හා බොහෝ ආයුධ සහිතව දේවීන් ගේ ප්‍රතිමා ආදිය නිර්මාණය කිරීම වැරදිය. ඒ පිංතූර අයත් භක්ති මාර්ගයටය. ඔවුන් එය ඇසින් දුටුවත් තේරුම් නොගනී. කිසිවකුගේ කාර්යය ඔවුන් නොදනී. ඔබ දරුවන් දැන් ජීවාත්මය පිළිබඳව හා උපත් 84 ගැන දනී. පරමාත්ම පියා ඔබට විස්තර කරනවා මෙන් ඔබ අන් අයටද විස්තර කර දෙන්න. ශිව බාබා හැම කෙනා වෙතටම නොයයි. පියාට නියත ලෙසම උදව් අවශ්‍යයි. ඒ නිසා මේ ඔබේ දිව්‍ය මෙහෙවර වෙයි. ඔබ හැම කෙනාවම පරමාත්ම දෙවියන්ට අයත් කරවයි. ඔහු හැම කෙනාගේම අසීමිත පියා බව ඔබ විස්තර කරයි. ඔහුගෙන් අසීමිත උරුමයක් අපට ලැබෙයි. ඔබ ලෞකික පියා සිහිකරනවා මෙන්ම ඊටත් වඩා පාරලෞකික පියා සිහිපත් කළ යුතුයි. භෞතික පියා තාවකාලික සතුට ලබාදෙන අතර අසීමිත පියා අසීමිත සතුටක් ලබාදෙයි. දැන් සියලු දෙනා මේ ඥානය ලබයි. ඔබ දැන් දන්නවා පියවරු තිදෙනෙක් ගැන ලෞකික පියා, අලෞකික පියා සහ පාරලෞකික පියා ලෙස. අසීමිත පියා අලෞකික පියා මඟින් මෙය විස්තර කර දෙයි. මේ පියා ගැන කිසිවෙක් නොදනී. බ්‍රහ්මාගේ චරිත කතාව කිසිවෙක් නොදනී. ඔහුගේ කාර්යය ද දත යුතුයි. ඔවුන් ශිවා හා ක්‍රිෂ්ණා පසසන නමුත් බ්‍රහ්මා පිළිබඳ පැසසුම කෙසේ ද? අශරීරික පියාට නියතයෙන්ම මුඛයක් අවශ්‍ය වන්නේ, එමගින් අමෘතය දිය හැකියි. භක්ති මාර්ගයේ දී පියා නිවැරදිවම සිහිකළ නොහැකිය. දැන් ඔබ දන්නවා මේ ශිව බාබාගේ රථය බව. රථ සරසනු ලබයි. හුසෙන්ගේ අශ්වයා ද සරසනු ලබයි. ඔබ දරුවන් මිනිසුන්ට හොඳින් කියා දෙයි. ඔබ සැවොම පසසයි. ඔබ ඔවුන්ට කියා දෙන්නේ ඔබ දේවී දේවතාවන්ව සිටි බවත් උපත් 84 ඇවෑමෙන් තමෝප්‍රධාන් වූ බවත්ය. දැන් ඔබ සතෝප්‍රධාන් වීමට නම් යෝගා අවශ්‍යමය. කොහොමනමුත්, කිසිවෙක් මෙය තේරුම් නොගනී. ඔවුන් මෙය තේරුම් ගත්තොත් සතුටේ මට්ටම වැඩි වනු ඇත. විස්තර කරන්නාගේ සතුටේ රසඳිය මට්ටම තවත් වැඩි වනු ඇත. අසීමිත පියා හඳුන්වාදීම යනු පොඩි දෙයක් නොවේ. ඔවුන්ට එය නොතේරේ. ඔවුන් මෙසේ අසයි මෙසේ වන්නේ කෙසේ ද? ඔබ අසීමිත පියා ගේ ජීවිත කතාව කියා දෙයි. පරමාත්ම පියා මෙසේ කියයි දරුවනි, දැන් පාරිශුද්ධත්වයට පත් වන්න! ඔබ මෙසේ හඬ නැඟීය පාරිශුද්ධකරුවාණනි, එන්න! ගීතාවේද 'මන්මනභාව්' වචනය සඳහන්ව ඇති නමුත් කිසිවෙක් එය තේරුම් නොගනී. පරමාත්ම පියා ජීවාත්මය පිළිබඳ ඥානය ඉතා පැහැදිලිව ලබා දේ. මෙම කරුණු කිසිම ආගමික පොතක නැත. ජීවාත්මය තිතක් ලෙස, දිදුලන තරුවක් ලෙස නළල මැද ඇත්තේය යැයි සඳහන්ව ඇතත් එය කිසිවකුගේ බුද්ධියෙහි පැහැදිලිව නැත. මෙය දත යුතුමය. කලියුගයේ දී සැම කෙනෙක්ම යුක්තිගරුක නැත. සත්‍යුගයේ දී සැවොම යුක්තිගරුකය. භක්ති මාර්ගයේ මිනිසුන් ඒ සියල්ල දෙවියන් හමුවීමේ ක්‍රම වශයෙන් විශ්වාස කරයි. ඔවුන් මෙහි විත් එය අරමුණ වශයෙන් සඳහන් කර පෝරම පුරවන්නේ ඒ නිසාය. මේ ලෙස අසීමිත පියා හඳුන්වා දිය යුතුය. ඔබ ඔවුන්ගෙන් මෙසේ ප්‍රශ්න කරයි.

සියලු දෙනාගේ පියා කවුද? ඔහු සර්වව්‍යාපී යැයි කීමේ තේරුමක් නැත. වඩාත්ම වැදගත් වන්නේ සියලු දෙනාගේම පරම පියා කවුද යන්නයි. ඔබට ඔබේ නිවෙස් වල සැමට මෙය විස්තර කර දිය හැකිය. කල්ප වෘකෂය, ඉණිමඟ සහ ත්‍රිමූර්ති පිංතූර තිබීම අවශ්‍යය. කල්ප වෘකෂ පිංතූරයෙන් අන්‍යාගම් වල අයට ඔවුන්ගේ ආගම කවදා ඇති වූයේ දැයි තේරුම් ගත හැකිය. මේ පදනමින් අපට දිව්‍යලෝකයට යා හැකියි. පසුව එන අයට දෙව්ලොව යා නොහැකි වුවද සාම දේශයට යැවේ. වෘකෂයේ පිංතූරය මගින් බොහෝ දෑ පැහැදිලි කළ හැකියි. පසුව එන ආගම් වල අය නියත ලෙසම එසේ ඉහළ රැඳී සිටිනු ඇත. මුලු පදනමම ඔබේ බුද්ධිය තුළ ඇත. පරමාත්ම පියා මෙසේ කියයි ආදී සනාතන දේවි දේවතා ධර්මය නම් වූ පැළය සිටුවා ඇතත්, ඔබ විසින් එහි තත්ත්ව නිර්මාණය කළ යුතුයි, පත්‍ර නොමැතිව ගසක් නැත. එසේ පත්‍ර නිමවිය යුතු නිසාය බාබා අපට කියන්නේ කෙසේ හෝ අන් අය ද අප හා සම කළ යුතුයි කියා. අන් ආගම් වල අය එසේ පත්‍ර නිම විය යුතු නැත. ඔවුන් ඉහළින් පැමිණ පදනම දැමූ පසු පත්‍ර ද ඉහළ සිට එන්නට පටන් ගනී. ඔබ වෘකෂය වර්ධනය වීම සඳහා ප්‍රදර්ශන පවත්වයි. මේ ආකාරයෙන් පත්‍ර මතු වේ. පසුව කුණාටුවක් ආ කල ඒවා මැලවී හෝ වැටී හෝ යයි. මෙසේ ආදී සනාතන දේවි දේවතා ධර්මය ස්ථාපිත වනු ඇත. මෙහි සටන් කිරීමක් ගැන ප්‍රශ්නයක් නැත. ඔබට ඇත්තේ පරමාත්ම පියා සිහිකිරීමත් අන් අයට ද පියා සිහිකිරීමට උනන්දු කරවීමත්ය. ඔබ සැමට කිව යුත්තේ නිර්මාණයෙන් උරුමයක් නොලැබිය හැකි නිසා නිර්මාණය අමතක කරන ලෙසයි. වෙන කිසිවෙක් නොව නිමැවුම්කරු වන පරම පියා පමණක්ම සිහි කළ යුතුයි. ඔබ ඥානය ලබා පියාට බාර වූ පසු අපිරිසිඳු ක්‍රියා කළොත් බොහෝ පව් එකතු වනු ඇත. පරම පියා පැමිණ ඇත්තේ ඔබ පවිත්‍ර කිරීමටයි. එසේ වුවද ඔබ එවැනි ක්‍රියා කළොත් ඔබ තව දුරටත් අපවිත්‍ර වනු ඇත. එම නිසයි බාබා කියන්නේ එවැනි පහත් ක්‍රියා නොකරන ලෙස. එසේ කළොත් පියාට අවනම්බු වෙයි. ඔබේ පාප ගිණුම වැඩිවන එවැනි ක්‍රියා නොකරන්න. ප්‍රවේසම් පියවර ගත යුතුය. ඖෂධ ප්‍රතිකාර ගන්නා විටත් ඔබ ප්‍රවේසම් විය යුතු වේ. ඔබේ වෛද්‍යවරයා ඇඹුල් වර්ග නොකෑ යුතු යැයි කී විට ඔබ එයට සවන් දිය යුතුය. ඔබ ඉන්ද්‍රිය පාලනය කළ යුතුයි. ඔබ රහසින් කෑවොත් එම ඖෂධයේ බලපෑම නැති වේ. එය ආසාවට වහල් වීමකි. ඒ අයුරින් පරමාත්ම පියා ද යම් යම් දේ ඔබට නොකරන ලෙස කියයි. ඔහු ශෛල්‍ය වෛද්‍ය විශේෂඥයායි. සමහර අයට විවිධ බොහෝ සිතිවිලි එන බව බාබාට ලියයි. ඔබ බොහෝ ප්‍රවේසම් විය යුතුයි. බොහෝ නරක සිතිවිලි ඔබට ඇති විය හැකියි. නමුත් බිය නොවිය යුතුයි. නරක සිහින දැකිය හැකියි. මේවා සත් යුගයේ දී හා ත්‍රේත යුගයේ දී සිදු නොවේ. ඔබ ත්‍රේත යුග තත්ත්වයට කිට්ටු වන විට ඔබේ ඉන්ද්‍රිය එම දඟකාරකම් නවතනු ඇත. ඉන්ද්‍රිය ඔබේ පාලනයට යටත් වනු ඇත. එම ඉන්ද්‍රිය පසුගිය සත්යුග, ත්‍රේත යුග වලදී පාලනය වී තිබුණි. ඔබ ත්‍රේත යුග තත්ත්වයට ළං වන විට ඉන්ද්‍රියන් ඔබේ පාලනය තුළට පත්වනු ඇත. ඉනික්බිතිව ඔබ සත් යුග තත්ත්වයට පත්වන විට ඔබ සතෝප්‍රධාන් බවට පත් වන අතර ඔබේ ඉන්ද්‍රිය මුළුමනින්ම පාලනය වනු ඇත. ඉන්ද්‍රිය ඔබ පාලනය කර තිබුණා නේද? මෙය අළුත් දෙයක් නොවේ. අද අපි ඉන්ද්‍රියන්ට යටවී ඇත, හෙට උත්සාහ කිරීමෙන් පසු ඒවා අප යටතට පත් වේ. ඔබ උපත් 84ක් පුරා පිරිහෙමින් පැමිණ ඇත. දැන ඉතින් ආපසු යා යුතුය. ඔබ සැම ඔබේ සතෝප්‍රධාන් තත්ත්වයට පත් විය යුතුය. ඔබේ සටහන බලා පින් කොතෙක් ද පව් කොතෙක් එකතු වී ඇත්දැයි බලන්න. බාබා සිහිකිරීම තුළින් ඔබ කලි යුගයෙන් ත්‍රේත යුගයට පැමිණෙන අතර ඔබේ ඉන්ද්‍රිය ඔබේ පාලනයට පත් වනු ඇත. එවිට ඔබට දැනේවි තව දුරටත් කුණාටු නැති බව. එම තත්ත්වයත් පැමිණේවි. එවිට ඔබ සත් යුගය කරා යයි. ඔබ පවිත්‍ර වීමට උත්සාහ කිරීමේ දී ඔබේ සතුටේ රසදිය මට්ටම ඉහළ යනු ඇත. ඔවුන්ට විස්තර කර දෙන්න ඔවුන් උපත් 84ක් ගන්නා ආකාරය. කොහොමනමුත්, උපත් 84ක් ගන්නා අය පමණක් මෙය තේරුම් ගනු ඇත. ඔවුන්ට මෙසේ කියන්න පරම පියා සිහිකිරීමෙන් ඔබ හිමිකරුවන් වනු ඇත. ඔවුන්ට උපත් 84 නොතේරේ නම් බොහෝ විට ඔවුන් රජදහනේ හිමිකරුවෝ නොවුන අය විය හැකිය. අපි ධෛර්යය දෙමින් හොඳ දේ තේරුම් කරමු. ඔබ පිරිහී ඇත. උපත් 84ම ගත් අය මෙය කෂණයෙන් වටහා ගනී. පරම පියා මෙසේ කියයි ඔබ සාම දේශයේ සිටින විට පවිත්‍රව සිටියා. මා දැන් ඔබට සාම දේශයට මෙන්ම සතුටේ දේශයටද පාර කියමි. වෙන කිසිවකුට ඔබට මඟ කියා දිය නොහැක. පිරිසිඳු වූ අයට පමණි සාම දේශයට යා හැක්කේ. ඔබ ගන්නා උත්සාහයට අනුව ඔබේ මළකඩ කඩා දමා ඉහළම තත්ත්වට පත්වේ. ඔබට එකිනෙකාගේ උත්සාහය දැනිය හැකි අතර බාබා ද බොහෝ උදව් දෙනු ඇත. මේ මගේ පරණම දරුවෙකි. හැම කෙනාගේම හද ගැස්ම ඔබ දත යුතුයි. දකෂ අය මුලින්ම අවබෝධ කර ගනී. මේ වූ කලී අසීමිත පියා වන අතර ඔබ නියතයෙන්ම ඔහු වෙතින් දෙව්ලොව උරුමය ලබනු ඇත. අපිට එය තිබුණා නමුත් දැන් එය නැති වූ අතර නැවත එය ලබමින් සිටිමු. අරමුණ සහ ඉලක්කය අප ඉදිරියේ ඇත. පරමාත්ම පියා දෙව්ලොව තැනූ කළ අප එහි හිමිකරුවෝව සිටියෙමු. ඉන්පසු උපත් 84ක් ගැනීමේදී අපි දිගටම පිරිහුනෙමු. මේ ඔබේ අවසාන උපතයි. ඉතිහාසය නියතයෙන්ම නැවත එසේම සිදු වනු ඇත. උපත් 84හි සම්පූර්ණ චක්‍රය කියා දෙන්න.

බොහෝ අය මෙය තේරුම් ගත් තරමට වෘකෂයේ පත්‍ර ද වැඩි වනු ඇත. ඔබ අන් බොහෝ අයද ඔබ හා සමානම කරවනු ඇත. ඔබ මෙසේ කියයි අප පැමිණ සිටින්නේ මායාගේ යදමින් මුළු ලොවම බේරා ගැනීමටයි. පරම පියා මෙසේ කියයි මම හැමකෙනාම රාවණ්ගෙන් බේරා ගැනීමට පැමිණෙන්නෙමි. පියා ඥාන සාගරය බව ඔබ දරුවන් දනී. ඔබ ඥානය ලබා ඥාන සාගරයේ හිමිකරුවන් වේ. ඥානයත් භක්තියත් එකිනෙකට වෙනස්ය. පරමාත්ම පියා පුරාණ භාරතයේ රාජයෝගය ඔබට උගන්වන බව ඔබ දනී. කිසිම මිනිසෙකුට මෙය කළ නොහැකියි. කොහොමනමුත්, හැම කෙනෙකුටම මෙය තේරුම් කරන්නේ කෙසේ ද? මෙහිදී යකෂයින් විසින් බොහෝ බාධා සිදුකරනු ඇත. කලින් අප විශ්වාස කළේ ඔවුන් අනවශ්‍ය දේ විසි කරන බව පමණි, නමුත් දැන් අප දන්නවා ඔවුන් විශාල බාධා කළ ආකාරය. මෙය අළුත් දෙයක් නොවේ. මෙය පසුගිය චක්‍රයේ ද සිදු විය. ඔබේ බුද්ධිය තුළ මුළු චක්‍රය ද කැරකේ. ලෝක චක්‍රයේ මුල, මැද හා අග බාබා තේරුම් කර දෙයි. බාබා අපට ප්‍රදීපස්ථම්භය යන නම ද දෙයි. එක ඇසක විමුක්තියේ දේශය වන අතර අනෙක් ඇසේ ඇත්තේ ජීවන මුක්ති දේශයයි. පළමුව අප සාම දේශයට ගොස් ඉනික්බිතිව සතුටේ දේශයට යා යුතුව ඇත. දැන් මෙය දුක් දේශයයි. පරමාත්ම පියා මෙසේ කියයි ඔබ භෞතික ඇසින් බලන සියල්ල අමතක කරන්න. ඔබේ සාම දේශය සිහිකරන්න. ජීවාත්ම විසින් පරමාත්ම පියා සිහිකළ යුතුව ඇත, මෙය වූ කලී අදූෂිත යෝග නම් වේ. එම කෙනාගෙන්ම ඥානය අසන්න, මෙය වූ කලී අදූෂිත ඥානයයි. ඔබ එම කෙනාම පමණක් සිහිකළ යුතුයි. මගේ වන්නේ ඔහුම පමණි වෙන කිසිවෙක් නොවේ. ඔබ ජීවාත්මයක් ලෙස ශ්‍රද්ධාව ඇති නොවුණොත් ඔබට ඔහු සිහිකළ නොහැකියි. ජීවාත්මය මෙසේ කියයි මම එකම එක පරමාත්ම පියාට පමණක් අයිති වෙමි. මම යා යුත්තේ බාබා වෙතටමයි. මේ ශරීරය වියපත්ව දිරා ගොස් ඇත. ඔබ එයට නොඇලී සිටිය යුතුයි. මෙය ඥානය සම්බන්ධ කරුණකි. ඉන් අදහස් වන්නේ ඔබ ශරීරය නොසලකා සිටීම නොවේ. අභ්‍යන්තරයෙන්ම ඔබ තේරුම් කරගත යුතුයි මෙය වියපත් සමක් බවත් මෙය දැන් හලා දැමිය යුතු බවත්. ඔබේ වූ කලී අසීමිත අත්හැරීමකි. සන්‍යාසීවරු කැලේට යන අතර ඔබ ගෙදර සිට සිහි කිරීම තුළ සිටිය යුතුයි. ශරීරය අතහරින විට සිහියෙන් සිටිය යුතුයි. ඔබ සිටින්නේ කොහේ වුවත් පරම පියා සිහිකරන්න. ඔබ හරි සිහියෙන් සිටිනවා නම් සහ ස්වදර්ශන චක්‍රය කරකවනවා නම් ඔබ කොහේ ජීවත් වුණත් ඉතා ඉහළ තත්ත්වයක් ලබා ගත හැකියි. ඔබම කරන උත්සාහය වැඩි වන තරමට ඔබ ලබනා තත්ත්වය ද උසස් වනු ඇත. ගෙදර සිටින ගමන්ම ස්මෘති වන්දනාවේ යෙදී සිටින්න. අවසාන ප්‍රතිඵලයට තව ඇත්තේ ඉතා සුළු කාලයකි. නව ලෝකය ද සූදානම්ව තිබිය යුතුයි. ඔබට දැන්ම කර්මටීට් තත්ත්වය ලැබුණොත් ඔබ සිටිය යුත්තේ සූකෂම කලාපයේය. සූකෂම කලාපයේ නැවතී සිටියා වුවද ඔබ නැවත උපතක් ගත යුතුය. ඔබ ඉදිරියට යන විට මේ සැම දේ ගැන දසුන් දකිනු ඇත. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පරමාත්ම පියාට පමණක්ම සවන් දෙන්න. ඒකායන ඔහු ගැන අදූෂිත සිහියෙන් සිටින්න. නොඇලී ශරීරය රැක බලා ගන්න.
2. පියා දී ඇති සියලු ප්‍රවේසම් සම්පූර්ණයෙන් අනුගමනය කරන්න. පියා අවනම්බුවට ලක් කරමින් පාප ගිණුම වැඩි කරගන්නා විදියේ ක්‍රියා නොකරන්න. ඔබ ඔබට පාඩු හානි නොකර ගන්න.

**වරදානය:** ඔබ ගුණධර්ම වල ප්‍රතිමූර්තියක් වී, ත්‍රිවිධ සේවයේ සමතුලිතතාවයක් පවත්වා ගනිමින් සියලු ගුණධර්ම අත්විඳිත්වා.

තම සැම සිතුවිල්ලකින්, වචනයකින් සහ ක්‍රියාවකින්ම නිරන්තරයෙන් සේවයේ නියැලෙන දරුවන් සාර්ථකත්වයේ ප්‍රතිමූර්ති වේ. ඔවුන් එම තුනෙහිම සමාන ලකුණු ලබාගෙන දවස පුරා තුනෙහිම සමතුලිතතාවයක් පවත්වා ගන්නා විට, ගෞරව සහිතව සමත් වී ගුණධර්ම වල ප්‍රතිමූර්ති බවට පත් වේ. සියලු දිව්‍ය ගුණධර්ම වල අලංකාර සැරසිලි ඔවුන් තුළ පැහැදිලිව දැකගත හැකිය. පරමාත්ම පියාගේ ගුණධර්ම සහ ඔබ උකහා ගත් ගුණධර්ම සමඟ එකිනෙකාට සහයෝගය දැක්වීම යනු ගුණධර්ම වල ප්‍රතිමූර්තියක් වීමයි, මන්ද ගුණධර්ම පරිත්‍යාගය ශ්‍රේෂ්ඨතම පරිත්‍යාගයයි.

**පාඨය:** ඔබගේ ශ්‍රද්ධා විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් වූ විට, ඔබ ස්වයංක්‍රීයව උතුම් ජීවිතයක් අත්විඳියි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ වීමට සහ කර්මතීත් බවට පත්වීමට ගැඹුරු සැලකිල්ලක් දක්වන්න.**

ඔබේ අතීත ක්‍රියාවන්හි කර්ම ගිණුමේ ප්‍රතිඵලයක් ලෙස, ඔබට ශරීරයේ රෝගයක් හෝ අන් අයගේ සංස්කාර සමඟ සංස්කාර ගැටුමක් ඇති විය හැකිය. කර්මතීත් බවට පත්වීමට නම්, කර්ම දුක්ඛිතභාවයෙන් බලපෑමට ලක් නොවී, ස්වාමියෙකු ලෙස ඔබේ ගිණුම් පියවා ගන්න. කර්ම යෝගිවරයෙකු වීමෙන් කර්ම දුක්ඛිතභාවය පියවා ගැනීම කර්මතීත් බවට පත්වීමේ ලකුණකි. එක් මොහොතක කර්ම යෝගිවරයෙකු වීමටත්, ඊළඟ මොහොතේ කර්මතීත් අවධියට පැමිණීමටත් පුරුදු වන්න.